සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

*Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry*

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number: ME/E/2(සබර/චක්‍රලේඛ) | ඔබේ අංකය / உமது இல / Your Numbe | දිනය / திகதி / Date: 2014.07. 23. |

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**
**: සබර/2014/21**

සබරගමුව පලාත් සභා පාසල් වල
සියළුම විදුහල්පතිවරුන් වෙත,

**පාසල් කාර්ය සහායක සේවක /සේවිකාවන්ගේ**
**චර්යා රටාව විධිමත් කිරීම**

පාසල් කාර්ය සහායක සේවක / සේවිකාවන් දෛනික රාජකාරි සඳහා තම පාසල වෙත පැමිණීමේදී තමා සැරසී පැමිණෙන ඇඳුම, හැසිරීම අවිධිමත්වීම පිළිබද ගැටළු රාශියක් මතුවන බව වර්තමානයේ ලැබෙන තොරතුරු අනුව පැහැදිලි වේ.

02. ඒ අනුව, ඔබගේ පාසල වෙත පත්කර ඇති / අනුයුක්ත කර ඇති පාසල් කාර්ය සහායක සේවක සේවිකාවන් සියළු දෙනා රාජකාරි සඳහා පැමිණීමේදී පහත පරිදි කටයුතු කරන ලෙසට නොපමාව ඔවුන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

1) **පාසල් කාර්ය සහායක සේවිකාවන් වෙනුවෙන්,**

සියළුම පාසල් කාර්ය සහායක සේවිකාවනට සුදුසු පරිදි ඔසරියකින් හෝ සාරියකින් සැරසී පැමිණෙන ලෙස උපදෙස් දිය යුතුය.

2) **පාසල් කාර්ය සහායක සේවකයින් වෙනුවෙන්,**

සියළුම පාසල් කාර්ය සහායක සේවකයින් සුදුසු පරිදි අත් කොට හෝ අත් දිග කමිසය සහ දිග කලිසමකින් සැරසී පැමිණෙන ලෙස උපදෙස් දිය යුතුය. කමිසය යටකර තිබිය යුතුය. (ටී ෂර්ට්, ඩෙනිම් කලිසම් සහ වෛවර්ණ ඇඳුම් නුසුසුසු ඇඳුම් වේ ) එසේ නොවන්නේ නම් ජාතික ඇඳුම විය යුතුය.

03. මෙම චක්‍රලේඛයේ උපදෙස් තරයේ පිළිපදින ලෙස මින් අවධාරණය කරමි.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය - රත්නපුර.

Ministry of Provincial Education * Sabaragamuwa *

මහින්ද එස්.වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් 01. සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි.හා අ.ක.ස.
02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි.හා අ.ක.ස.
03. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.පි.හා මෙම චක්‍රලේඛය සියළුම විදුහල්පතිවරුන් වෙත ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.